# ලාංකේය සිනමාවේ කාන්තා ප්‍රතිරූපය පිළිබඳ අධ්‍යයනයක්

(තෝරාගත් සිනමාකෘති කීපයක් ඇසුරිණි)

කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ ජනසන්නිවේදනය පිළිබඳ සමාජීය විද්‍යාපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධිකාවකි.


| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 683 |
| වර්ග අංකය | |



නම : ඩබ්.එච්.චමිලා පුෂ්පරාණි

ශිෂ්‍ය අංකය : FGS/M/MSSC/2006/33


ඉදිරිපත් කරන ලද වර්ෂය : 2008

# නිබන්ධ සාරාංශය

මෙම පර්යේෂණය, ලාංකීය සිනමාවේ  කාන්තා ප්‍රතිරූප පිළිබඳව අශෝක හඳගමගේ තනි තටුවෙන් පියාඹන්න (2003) , චන්න පෙරේරාගේ අංජලිකා (2005) හා රන්ජන් රාමනායකගේ වන්පොට් (2005) යන චිත්‍රපට ඇසුරින් කරනු ලැබුවකි. එහිදී **ලාංකීය සිනමාවේ කාන්තා ප්‍රතිරූප ප්‍රේක්ෂක රුචිකත්වය වර්ධනය වීම කෙරෙහි බලපාන්නේද යන ගැටළුව මූලික කරගත් අතර, පර්යේෂණ උපන්‍යාසය වශයෙන් ගනු ලැබුයේ ලාංකීය සිනමාවේ කාන්තා ප්‍රතිරූප ප්‍රේක්ෂක රුචිකත්වය වර්ධනය වීම කෙරෙහි බලපායි යන්නය.**  පුස්තකාල පරිහරණය, සම්මුඛ සාකච්ඡා, අන්තර්ගත විශ්ලේෂණය, ප්‍රශ්නාවලී යනාදී පර්යේෂණ ක්‍රමවේදයන්ට අනුව ලබාගත් තොරතුරු විශ්ලේෂණයෙන් මෙම පර්යේෂණ උපන්‍යාසය සත්‍යාක්ෂණය වූ අතර  ප්‍රේක්ෂක රුචිකත්වය ලබා ගැනීම චිත්‍රපටයක අත්‍යාවශ්‍ය කාරණයක් වන බවත්, ඒ සඳහා සිනමාකරුවෝ විවිධ උපක්‍රම භාවිත කරන බවත් ගම්‍ය කෙරිණ. එසේම කාන්තා ප්‍රතිරූප නිර්මාණය එහි ප්‍රබලතම භූමිකාවක් වන අතර, නිර්මාණාත්මක සිනමා කෘති හා ජනප්‍රිය ආකෘතියේ චිත්‍රපට මෙම කාරණයේදී හැසිරෙන ආකාරයන් එකිනෙකට වෙනස් බවත් මෙහිදී ප්‍රේක්ෂක රුචිකත්වයේ ස්වභාවයන්ද එකිනෙකට වෙනස් බවත් අනාවරණය විය. නමුත් පෙළඹවීමේ උපක්‍රම මගින් ඕනෑම සිනමා කෘතියකට ප්‍රේක්ෂක රුචිකත්වය ලබා ගැනීමේ හැකියාව පවතින බවත් පර්යේෂණයෙන් හෙළිවිය. මෙම සියළු කාරණා ඉදිරිපත් කිරීමේදී පර්යේෂණ අධ්‍යයනය කොටස් හයකට බෙදා දැක්වූ අතර පළමුවෙනි පරිච්ඡේදයෙන් පර්යේෂණ අධ්‍යයනය පිළිබඳව කෙරෙන හැඳින්වීමත්, දෙවැනි පරිච්ඡේදයෙන් සිනමාව හා කාන්තා ප්‍රතිරූප පිළිබඳවත් සාකච්ඡා කෙරෙන අතර, තෙවැනි පරිච්ඡේදයෙන් සිනමාව හා ප්‍රේක්ෂක රුචිකත්වය පිළිබඳව අධ්‍යයනයකුත් යෙදේ. සිවුවැනි පරිච්ඡේදයෙන් සිදු කෙරෙන්නේ තෝරාගත් සිනමා කෘති **(තනි තටුවෙන් පියාඹන්න, අංජලිකා, හා වන්ෂොට්)** පිළිබඳ අධ්‍යයනකි. පස්වන පරිච්ඡේදයෙන් ප්‍රේක්ෂක සහභාගීත්ව දත්ත විශ්ලේෂණය ඉදිරිපත් කළ අතර, සය වැනි පරිච්ඡේදයෙන් සෙසු පරිච්ඡේද වලින් ලබාගත් දත්ත ඔස්සේ යමින් නිගමන සහ යෝජනා ඉදිරිපත් කෙරේ. මෙම පර්යේෂණයේ දත්ත විශ්ලේෂණයෙන් අවසාන වශයෙන් සාධනය වූයේ ලාංකීය සිනමාවේ කාන්තා ප්‍රතිරූප ප්‍රේක්ෂක රුචිකත්වය වර්ධනය කිරීම

කෙරෙහි බලපාන බවයි. නමුත් ප්‍රේක්ෂක රුචිකත්වය වර්ධනය වීම කෙරෙහි බලපාන එකම සාධකය එය නොවන අතර, ඒ සඳහා බලපාන සෙසු සාධක රැසක්ම පවත්නා බවයි.